**අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය - 2023**

**------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

**1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 49 ඡේදය ප්‍රකාරව, එක් පන්තියකට අයත් වත්කම් ප්‍රත්‍යාගණනය කරන විට අදාළ වත්කම් පන්තිය එකවර ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද ඊට පටහැනිව කොටස් වශයෙන් ප්‍රත්‍යාගණනය සිදු කර තිබුණි. ඒ අනුව 2023 දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලි ගිණුම් ශේෂය රු.217,592,705 ක් වුවද ඉන් රු. 44,929,705 ක් වූ ගොඩනැගිලි පිරිවැයටත් රු. 172,663,000 ක් වූ ගොඩනැගිලි ප්‍රත්‍යාගණ අගයටත් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් කර ඇති අතර නිලධාරීන්ගේ පැමිණීම අනුව ඉදිරියේදී ප්‍රත්‍යාගණන කටයුතු සිදු කිරීමට පියවර ගනිමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 හි 65 ඡේදය ප්‍රකාරව, වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩුතරමින් සෑම | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 05 ඡේදයෙහි දක්වා ඇතත් වත්කමක අවශේෂ වටිනාකම සහ | -එම- |

| | | |
|---|---|---|
| | වාර්ෂික වාර්තාකරන කාලපරිච්ඡේදයක් අවසන් වන දිනයේ දී සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.43,265,362 ක් වූ මෝටර් වාහන හා ජංගම නොවන වත්කම් වටිනාකම රු 928,085 ක මෘදුකාංග පද්ධතියේ ඵලදායී ජීවිත කාලය නිවැරදිව ඇස්තමේන්තු නොකිරීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට ඒවායේ වටිනාකම ශුන්‍ය වී තිබුණි. ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රයෝජනවත් ජීවිත කාලය සෑම වාර්ථාකරණ කාලපරිච්ඡේදයක් අගදීම සමාලෝචනය කිරිම ප්‍රායෝගිකව කළ නොහැකි අතර සියළුම මෝටර් රථ එකවර ප්‍රත්‍යාගණනය කර 2024 වර්ෂය තුළ දී ගිණුම්ගත කිරිමට තීරණය කරන ලදි. |

### 1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 19 යෙහි පරිච්ඡේද අංක 140 අනුව අස්ථිත්තයක් එහි නිර්වචිත ප්‍රතිලාභ සැලසුම්වල ස්වභාවය සහ එම කාල පරිච්ඡේදය තුළ එම සැලසුම් වල මූල්‍ය බලපෑම්වල වෙනස්කම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශන පරිශීලකයන්ට ඇගයීමට හැකිවන තොරතුරු හෙළිදරව් කල යුතුය. තවද පරිච්ඡේද අංක 141 (ග) අනුව වැටුප් වැඩි කිරීමේ අනුපාතිකය ගණනය කිරීම පිළිබඳව වට්ටම් අනුපාතිකය නිර්ණය කළේ කුමන පදනමින්ද යන්න හෙළිදරව් කර නොතිබුණි. මෙහිදී ගිණුම්කරණ ප්‍රතිපත්තිය වෙනස්වීම මත මූල්‍ය ප්‍රකාශන වලට වූ බලපෑම සටහනක් තුළින් හෙළිදරව් කල යුතු වුවද ඒ අනුව ද කටයුතු කර නොතිබුණි. | ප්‍රමිතියෙහි 11 (ග) අනුව හෙළිදරව් නොකිරීම මණ්ඩලයේ දෝෂයකි ඉදිරියේදී මෙවැනි දෑ හෙළිදරව් කිරීමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.4 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1992 වර්ෂයේදී 99 අවුරුදු බදු පදනම මත ලබා ගෙන තිබූ ප්‍රධාන කාර්යාලය ඉඩම 2018 වර්ෂයේදී රු.365,000,000 ක වටිනාකමකට ප්‍රත්‍යාගණය කර ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. තවද බදු දේපල වටිනාකම වෙන්ව දැක්විය යුතු වුවත් ඉඩම් වල වටිනාකම යටතේ ගිණුම්ගත කර තිබුණි. මෙම ඉඩමේ බදු වටිනාකම රු 4,350,000 ක් වූ අතර වාර්ෂික ක්‍රමක් ක්ෂය වටිනාකම් එකතුව රු 1,318,182 ක් වුවත් එම වටිනාකම ගිණුමට ගෙන නොතිබුණි. | මෙම ඉඩම 1992 වර්ෂයේ කල්බදු( මූල්‍ය )පදනම මත ලබාගත් එකක් වන අතර “ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක -12 කල්බදු” හි 84 පරිච්ඡේදයට අනුව 2018 ජනවාරි 01දින සිට ප්‍රථම ආරම්භ වන ගිවිසුම් සඳහා ක්‍රමක්ෂය ප්‍රතිපත්තිය අනිවාර්ය නොවේ. | මූල්‍ය ප්‍රකාශන වලට නිවැරදි වටිනාකම් ඇතුළත් කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වටිනාකම රු 4,085,019 ක් වූ 30 අවුරුදු බදු පදනම මත ලබාගෙන ඇති හෝමාගම පිටිපන ඉඩම, ඉඩම් ගිණුම යටතේ දක්වා තිබුණද බදු ඉඩම් ගිණුමට ගෙන වාර්ෂිකව ක්‍රමක්ෂය කිරීමටද කටයුතු කර නොතිබුණි. | ගිවිසුමකට එළඹි පසු පෙර වර්ෂ ගැළපුම් ජ'නල් සටහනක් මඟින් ,ගෙවී ගිය වර්ෂ වලට අදාළ ක්‍රමක්ෂය ප්‍රමාණය ගිණුම් වල ගැළපීමට කටයුතු කරමි | මූල්‍ය ප්‍රකාශන වලට නිවැරදි වටිනාකම් ඇතුළත් කිරීමට කටයුතු කල යුතුය |
| (ඇ) | 30 අවුරුදු බදු පදනම මත ලබා ගෙන ඇති ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු නවදිගන්තය පුනරුත්ථාපන මධ්‍යස්ථාන ඉඩම 2016 මාර්තු 04 වන දිනට බදු ගිවිසුමට අනුව බදු වටිනාකම රු13,062,750 ක් වූ අතර වාර්ෂික පදනමින් කල්බදු කුළී ගෙවීම සිදු කර ගෙවූ බදු වටිනාකම පමණක් ගිණුම්ගත කර තිබුණි. බදු වටිනාකම මූල්‍ය තත්ව ප්‍රකාශයේ බදු ඉඩම් යටතේ දක්වා නොතිබුණි. | මෙය 2016 මාර්තු 03දක්වා වර්ෂ 30ක් සඳහා ලබා ගෙන ඇති අතර ,ඉන්පසුව නැවතත් 2016 මාර්තු 04 සිට 2046 මාර්තු 03 දක්වා වර්ෂ 30ක් සඳහා ලබා ගෙන ඇති උක්ත දෙවන ගිවිසුමට අනුව කල්බදු කුළී වර්ෂ 05 කට වතාවක් සංශෝධනය කරන අතර ගෙවීම වාර්ෂිකව සිදු වේ. | බදු වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල දැක්වීමට කටයුතු කළ යුතුයි. |
| (ඇ) | බදු පදනමට ලබාගත් ඉඩම් යටතේ රාජගිරිය ප්‍රධාන කාර්යාල ඉඩම, හෝමාගම පිටිපන ඉඩම හා නවදිගන්ත ඉඩම දැක්විය යුතු වුවත් නවදිගන්ත ඉඩම සඳහා ගෙවන ලද රු 905,635 ක් හා හෝමාගම ඉඩම සඳහා ගෙවන ලද රු 107,627ක වටිනාකම් සඳහා පමණක් ක්‍රමක්ෂය ගැලපීම සිදු කර තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන සටහන 2.3 යටතේ සියලුම බදු ඉඩම් පිළිබඳව හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. | මූල්‍ය කල්බදු පදනම යටතේ මණ්ඩලය විසින් ලබා ගෙන ඇත්තේ ප්‍රධාන කාර්යාල ඉඩම හෝමාගම පිටිපන ඉඩම හා නවදිගන්ත මාහේන ඉඩම යන ඉඩම් තුන පමණි) .නමුත් හෝමාගම පිටිපන ඉඩම සඳහා මෙතෙක් කල්බදු ගිවිසුමකට එළඹ නැත. මූල්‍ය ප්‍රකාශන වල .2.3 සටහන යටතේ ගාල්ල මධ්‍යස්ථානයේ ඉඩම සහ තලංගම මධ්‍යස්ථානයේ ඉඩම පිළිබඳව හෙළිදරව්වක් කර නැත. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. බදු පදනම මත ලබාගත් සියළුම ඉඩම් වෙනුවෙන් ක්‍රමක්ෂය ගැලපීමට කටයුතු කල යුතුය. |
| (ඉ) | මූල්‍ය ප්‍රකාශනයන්හි අත්තිකාරම් යටතේ ගිණුම්ගත කිරීම වෙනුවට යන්ත්‍ර හා උපකරණ යටතේ ප්‍රාග්ධනගත කර ඇත. ලෙස සඳහන් විගණන නිරීක්ෂණය සමඟ එකඟ වෙමි.මෙය 2024වර්ෂය තුළදී ගිණුම් වල නිවැරදි කිරීමට කටයුතු කරමි . | වියදම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. | |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාලෝචිත වර්ෂයේදී පාරිතෝෂික වෙන්කිරීම් වටිනාකම රු .42,856,163 ක ශේෂය තුල සේවයේ නොමැති නිලධාරීන් හතරදෙනෙකු සඳහා ද රු. 1,973,454 ක පාරිතෝෂික වෙන්කිරීම් සිදු කර තිබුණි. මේ හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම නොවන වගකීම් වටිනාකම රු. 1,973,454 කින් වැඩියෙන් දක්වා තිබුණි . | සේවයේ නොමැති නිලධාරින් 4දෙනෙකු සඳහා රු1,973,454.00.ක “පාරිතෝෂික ප්‍රතිපාදන සේවක ලැයිස්තුව” තුළ ඇතුළත් වටිනාකම දෝෂ 2024 වර්ෂය තුළ නිවැරදි කරමි. | මූල්‍ය ප්‍රකාශන වලට නිවැරදි අගයන් ඇතුළත් කල යුතුය. |

**1.5.5 අවිනිශ්චිත ගිණුම්**

| නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවිනිශ්චිත ගිණුමෙන් රු.295,214 ක හර ශේෂයක් වර්ෂ දෙකක කාල පරාසයක සිට පැවතුණි. | ශේෂය හඳුනා ගෙන නිරවුල් කිරීමට හැකි සෑම උත්සාහයක්ම ගන්නා බව දන්වා සිටිමි. | අවිනිශ්චිත ගිණුමේ ශේෂය හැකි ඉක්මණින් හඳුනා ගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම.**

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ප්‍රාග්ධන සංචිත | 65,503.711 | ලෙජර් ගිණුම් හා ජනල් සටහන් | ප්‍රාග්ධන සංචිත ශේෂය 2016.12.31 දින සිටම නොවෙනස්ව පැවතී ඇත. ඊට පෙර මෙම ශේෂය ජනිත වී ඇති ආකාරය පැහැදිලිව පොත් වලින් සොයාගැනීම සඳහා අපහසුතාවයක් පවතී. | ශේෂය හඳුනා ගැනීමට කටයුතු කල යුතුය |
| තැන්පතු සහතික | 566,263 | තැන්පතු සහතික පත්‍ර | මෙම තැන්පතු වලට අදාල සහතික අතීතයේ අස්ථානගත වී ඇත. | ශේෂය ඊට අදාල ආයතන මගින් තහවුරු කර ගැනීමට කටයුතු කල යුතුය.. |

**1.6 ලැබිය යුතු ගිණුම්**

**1.6.1 අත්තිකාරම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසර 20 කට වඩා වැඩි කාලයක සිට අය නොවී පවතින අත්තිකාරම් | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 2020/01ට අනුව , ඊට අදාළ හානි සම්බන්ධයෙන් බලයලත් | අත්තිකාරම් ශේෂයේ |

| | | |
|---|---|---|
| ගිණුමේ පැවති රු.1,434,534 ක හර ශේෂය අයකර ගැනීමට අවශ්‍ය පියවර ගැනීම් පිළිබඳව ලිඛිත තොරතුරු වගකිව යුතු අංශ සතුව නොපැවතුණු අතර එකී විස්තර විගණනය වෙත ඉදිරිපත් නොවුණි. | නිලධාරියාට යොමු කොට එම ශේෂයන් කපා හැරීම සඳහා කටයුතු කරන ලෙස උපදෙස් ලැබී ඇත . ඒ අනුව 06 /06/2024 , දින මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් ගේ අනුමැතිය සඳහා ලිපියක් යොමු කොට ඇත. | නිරවද්‍යතාව ය සනාථ කර ගැනීමට කටයුතු කළ යුතුයි. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝවර්තක නිති විරෝධි ලෙස ජාවාරම් කිරිම සම්මුති පනතේ 18 වැනි වගන්තිය සමඟ 31 වන වගන්තිය හා අණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදයට අනුව සාදනු ලැබු නියෝග අංක 1653/7-2010 මැයි 10 දින අති විශේෂ ගැසට් පත්‍රය | | | |
| i IV වැනි කොටස පරිශ්‍ර ලියාපදිංචි කිරීම නියෝග 9 | ද්‍රව්‍ය ආනයන කිරීමට හෝ අපනයන කිරීමට අදාල වන කාර්යයන් කරගෙන යන්නා වූ පරිශ්‍රයන් බලපත්‍ර නිකුත් කල දින සිට මාසක් ඇතුළත සෑම බලපත්‍රලාභියකු විසින්ම අධිකාරිය සමඟ ලියාපදිංචි විය යුතු අතර පරිශ්‍ර 16 ක් ලියාපදිංචි කර 10 කට බලපත්‍ර නිකුත් තර තිබුණි. අධිකාරියේ සාමාජිකයින් අවම වශයෙන් මාස 3 ට වරක් වත් බලපත්‍රලාභියාගේ ලියාපදිංචි කරනු ලැබූ පරිශ්‍රයට පැමිණ ක්‍රියාකාරකම් පිළිබඳ අධික්ෂණය කළ යුතු අතර , ද්‍රව්‍යයන් ගබඩා කර ඇති ආකාරය , උපකරණ භාවිතය පවත්වාගෙන යනු ලබන පොත් ලේඛන රෙජිස්ටර් සහ වාර්තා පරීක්ෂා කර යුතු වූවත් | පුරෝගාමී පාලන අධිකාරියේ සේවය කරන නිලධාරීන් දෙදෙනා හට ප්‍රායෝගිකව ආනයන බලපත්‍ර ලාභීන්ගේ පරිශ්‍ර 51 ක් පරීක්ෂා කිරීමට හැකි වී තිබුණු අතර එම නිලධාරීන් දෙදෙනාගේ උපරිම ධාරිතාවය බැවින් පවතින සේවක පුරප්පාඩු පිරවීමෙන් පසුව ඉතිරි පරිශ්‍ර විමර්ශනය කිරීමේ හැකියාව ඇත. | පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | 2023 වර්ෂයේ බලපත්‍රලාභී ආනයන කරුවන් 91 දෙනෙකුගේ පරිශ්‍ර 51 පමණක් පරීක්ෂා කර තිබුණි. | | |
| ii | VI වැනි කොටස වෙළෙන්දන් සහ අවසන් භාවිතා කරන්නන් | නිශ්චිතව සඳහන් කර ඇති ද්‍රව්‍යන් විකිණීමට අදහස් කරන හෝ එම ද්‍රව්‍ය භාවිතා කිරීමට අදහස්කරන අවසන් භාවිතා කරන්නන් විසින් පුරෝගාමී අධිකාරියට ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර ලියාපදිංචි විය යුතුය. 2023 වර්ෂයේ බලපත්‍ර ලබාගැනීම හා ලියාපදිංචි කිරීම් ලේඛන නිරීක්ෂණය කිරීමට පහසුකම් ලෙස වාර්තා වෙන් වෙන්ව දත්ත පද්ධතියකට ඇතුළත් කර නොතිබුණි. | දත්ත පද්ධති සකස් කර තිබුණද සීමිත කාර්ය මණ්ඩලයක් සමගින් ඒවා යාවත්කාලීන කිරීම් නිසි පරිදි සිදුකිරීම අපහසු වී තිබේ. එසේ වුවද සියළු දත්ත වෙන වෙනම පොත් වලට ඇතුලත් වන අතර ඒවා ලිපි ලේඛන ලෙස පවත්වාගෙන යනු ලබයි. | -එම- |
| iii | නියෝග 5 ඡේද | පුරෝගාමී පාලන අධිකාරියේ බලතල කාර්යයන් හා කර්තව්‍යන් ක්‍රියාත්මක කිරිම ,ඉටුකිරිම සහ සිදුකිරිම සඳහා අවශ්‍ය විය හැකි ලේකම්වරයෙකු සහ වෙනත් නිලධාරීන් සහ සේවකයන් අධිකාරිය විසින් පත්කරනු ලැබිය යුතු වුවද පූරෝගාමී අධිකාරියට 2023 වර්ෂය අවසන් වන තුරු අවශ්‍ය වන කාර්යය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු සිදු කර නොමැති අතර අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ නිලධාරින් දෙදෙනෙකු පමණක් අනුයුක්ත කර තිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අංක DMS/1683/Vol –III හා 2017.01.11 දිනැති ලිපිය මගින් පුරෝගාමී පාලන අධිකාරිය සඳහා අනුමත කර තිබූ ලේකම් තනතුර ඉවත් කර ඇති අතර රසායනඥ තනතුර නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ පුරෝගාමී රසායන ලෙස වෙනස් කර ඇත. විද්‍යාත්මක නිලධාරින් 05ක් බඳවා ගැනීම සඳහා සම්මුඛ පරික්ෂණ පවත්වා අවසන් කර ඇති අතර එම බඳවා ගැනීම් සිදුකිරීමෙන් පසු මණ්ඩලයේ පුරෝගාමී පාලන අධිකාරිය එම නිලධාරින් අනුයුක්ත කිරීමට නියමිතව ඇත. | -එම- |
| (ආ) | 2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝවර්තක නීති විරෝධි ලෙස ජාවාරම් කිරිමට එරෙහි සම්මුති පනතේ | එම පනතේ විධිවිධාන වලට යටත්ව අධිකාරියේ පාලක මණ්ඩලය 2023 වර්ෂයේ එක් අවස්ථාවක් පමණක් රැස් වී තිබූ අතර නියෝග 10 ඡේද | මේ කාලවකවානුවේදී ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා ප්‍රමාණවත් කරුණු උද්ගත වී නොතිබුණ අතර, කිසිදු මාණ්ඩලික | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |

| | | | | |
|---|---|---|---|---|
| | නියෝග 8 ඡේදය හා නියෝග 10 ඡේදය | ප්‍රකාරව එහි කාර්යයන් පිළිබඳ පුරෝගාමී අධිකාරියේ පාලක මණ්ඩලයේ සාමාජිකයන් විසින් සමාලෝචනය සිදු කිරීම සඳහා පුරෝගාමී අධිකාරියේ මණ්ඩලය අවම රැස්වීම් ප්‍රමාණය හෝ පවත්වා නොතිබුණි. | පත්‍රිකාවක් ඉදිරිපත් නොවූ බැවින්, ආයතනයේ එදිනෙදා කටයුතු සුමටව සිදු වූ බැවින් ද රැස්වීම් කමිටුවේ අවශ්‍යතාවයන් මතු නොවූ අතර, එලෙස අවශ්‍ය වූ සෑම අවස්ථාවකදීම රැස්වීම් කැඳවා අවශ්‍ය තීරණ ගැනීමට කටයුතු කර ඇත. | |
| (ඇ) | 2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පනතට අනුසාංගිකව නිකුත් කරන ලද 2010 මැයි 12 දිනැති අංක1653/19 -2010 ගැසට් පත්‍රය නියෝග අංක 2 | ඖෂධ වලට ඇබ්බැහි වූ තැනැත්තන් රැක බලා ගැනීම හා පුනරුත්ථාපනය කිරීමේ කාර්යය සඳහා නියෝග ප්‍රකාරව බලපත්‍රයක් ලබා ගැනීමකින් තොරව පවත්වාගෙන යා නොහැකි වුවද, 2023 වර්ෂය අවසන් වන විට පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන 26 ක් රට තුල පැවති අතර පෞද්ගලික පුනරුත්ථාපන මධ්‍යස්ථාන 13 ක් බලපත්‍ර ලියාපදිංචිය යාවත්කාලීන කිරිම සඳහා ආරක්ෂණ නිෂ්කාශනය ලබා ගැනීමට යොමු කර තිබුණි. | පෞද්ගලික පුනරුත්ථාපන මධ්‍යස්ථාන සඳහා බලපත්‍ර ලබා දෙනු ලබන්නේ ඊට අදාළ ආරක්ෂක නිෂ්කාශන වාර්තා ගැටළුවකින් තොර බවට පොලිස් දෙපාර්තමේන්තුව මඟින් තහවුරු කිරීමෙන් පසු වන බැවින් පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන 13කට 2023 වර්ෂයේදී බලපත්‍ර ලබා දීම සඳහා ආරක්ෂක නිෂ්කාශන වාර්තාව මේ වන තෙක් ලැබී නොමැත. ඒ සම්බන්ධව මහජන ආරක්ෂක අමාත්‍යාංශය දැනුවත් කර ඇති අතර එම වාර්තා ලැබුණු පසු ඉතිරි පෞද්ගලික මධ්‍යස්ථාන 13 සඳහා බලපත්‍ර ලබා දීම සිදු කිරීමට නියමිතයි | පනතේ විධිවිධාන ප්‍රකාරව සකසා ඇති නියෝග අනුව කටයුතු කල යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | 1. මුදල් රෙගුලාසි 880 | ආයතනයේ ඇප තැබීමට අවශ්‍ය නිළධාරින් හඳුනා ගෙන නොමැති අතර, (612 වැනි අධිකාරය) රජයේ නිළධාරීන්ගේ ඇප ආඥා පනත අනුව ඇප තබා නොතිබුණි. | මුදල් රෙගුලාසි 880 හි සඳහන් පරිදි ඇප ආඥ පනතේ සඳහන් 612 වෙනි අධිකාරය යටතේ වන, රාජ්‍ය නිලධාරින් ඇප තැබිය යුතු වුවත් ප්‍රායෝගික මෙය කළ නොහැක. මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලය තුළ අයකැමි තනතුර | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | නොමැති අතර මුදල් රැස්කිරීම සහ සුළු මුදල් ගෙවීම් භාරව සිටිනුයේ කළමනාකරණ සහකාරවරුන් හෙයින් එය ඔවුන්ට පැවරූ අමතර රාජකාරියක් නිසා ඇප තැබීමට නියෝග කළ නොහැක. | |
| (ඉ) | රක්ෂණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම | 2011 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක 4.616 අනුමැතිය මත ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමඟ වූ රක්ෂණ ප්‍රතිලාභ ක්‍රමය 2022 වර්ෂයේ මුදල් ප්‍රතිපාදන නොමැති වීම මත අත්හිටුවා තිබුණි. 2023 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන වෙන්කිරීම රු. මිලියන 5ක සීමාව තුල මිල ගණන් කැඳවා තෝරාගත් රක්ෂණ ආයතන සමඟ රක්ෂණ ප්‍රතිලාභයෝජනා ගිවිසුම 2023 ඔක්තොම්බර් 1 දින සිට 2024 සැප්තැම්බර් 30 දක්වා කාලපරිච්ඡේදයට අදාලව එක් සේවකයෙකුගේ වාර්ෂික වාරික වටිනාකම රු 26,645 ක්ද මණ්ඩලයේ වසරක් සම්පූර්ණ කර ඇති සේවකයන් 201 ක පවුල්වල සාමාජිකයන්ද සමඟ මුළු සාමාජිකයන් 597ක් ආවරණය වන පරිදි පුද්ගලික රක්ෂණ සමාගමක් සමඟ රු5,677,525 ක වාර්ෂික වටිනාකමකට ගිවිසුම් ගත වී තිබුණි.මේ සඳහා මණ්ඩලයේ නිලධාරීන්ගෙන් කිසිඳු මූල්‍ය දායකත්වයක් ලබා ගෙන නොතිබූ අතර විගණන දිනය වන විට රක්ෂණ ප්‍රතිලාභ ලෙස සේවකයන්ට රු 2,071,063 ක් රක්ෂණ ආයතනයෙන් ලබා ගෙන තිබුණි. එසේ වුවද නව රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා | සේවක රක්ෂණ යෝජනාක්‍රමය වර්ෂ 10 කට අධික කාලයක් පැවතුණි. 2022 වර්ෂය සඳහා රක්ෂණය සඳහා ගෙවීමට වන දායක අරමුදල ද පෙර ලබාදුන් මිලගණන් වලට වඩා වැඩි බැවින් එම වරප්‍රසාද සහිත වෙනත් නියෝජිතවරයෙක් තෝරා පත් කර ගැනීම උදෙසා ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීම සඳහා ප්‍රසම්පාදන කමිටුව වෙත යොමු කර එම ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීමේදී, ප්‍රසම්පාදනය සඳහා සභාපතිවරුන් මාරුවීම හා පවතින මුදල් වර්ෂය අවසන්වීම ද යන කරුණු මත මෙම රක්ෂණාවරණය අදාල වර්ෂයේදී ලබා ගත නොහැකිවිය. නමුත් ඉන්පසුව එළඹි වර්ෂය තුලදී නැවතත් ප්‍රසම්පාදන කටයුතු සිදුකර ඇත. 2011.03.30 පැවති 348 වැනි මණ්ඩලීය රැස්වීමේ තීරණය අනුව, මණ්ඩලයේ නිලධාරීන් වෙත, සෞඛ්‍ය රක්ෂණාවරණය ලබා දීමට අනුමැතිය ලබා දී තිබූ බැවින් නැවත මණ්ඩලීය පත්‍රිකාවක් අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් නොකරන ලදී. | රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය හා මහා භාණ්ඩාගාරයේ අයවැය දෙපාර්තමේන් තුවේ අනුමැතිය ලබාගත යුතුය. |

| | | |
|---|---|---|
| | මහා භාණ්ඩාගාර අයවැය දෙපාර්තමේන්තුවේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,248,627 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.48,359,337 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.46,110,710 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රජයේ දායකත්වය පසුගිය වර්ෂයට වඩා රු. 28, 867,000 කින් ඉහළ යාම සහ වෙනත් විවිධ ආදායම් රු. 15,500,560 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 අප්‍රේල් 30දින ,තිස් අවුරුදු බදු පදනම මත රු.4,,085,018කට ලබාගෙන ඇති හෝමාගම පිටිපන ඉඩම වසර 8 ක් ගතව තිබියදීත් නිශ්චිතව යොදාගනු ලැබීමට අපේක්ෂිත කාර්යය නාගරික සංවර්ධන අධිකාරිය වෙත දැනුම් දී නොතිබුණු අතර, 2023 දෙසැම්බර් 31 දින වන විටත් ඉඩමට අදාල බදු ඔප්පුව ලබා ගෙන නොතිබුණි. මෙම ඉඩම ඵලදායී කාර්යයකට යොදා ගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි . | රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වය යටතේ මෙම ඉඩම තුළ ගොඩ වැදීමේ මධ්‍යස්ථානයක් හෝ උපදේශන මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා ව්‍යාපෘති යෝජනාවක් සකස්කර ඉල්ලීමක් සහිතව පෞද්ගලික හා රාජ්‍ය නොවන ආයතන වෙත ඉදිරිපත් කරමින් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. මෙම ඉඩම පවරා ගැනීමට කටයුතු කරගෙන යනු ලැබේ. | මෙම ඉඩම ඵලදායී කටයුත්කට යොදවා කටයුතු ගැනීමට කල යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මෙම මධ්‍යස්ථානයට හිමිනමකගේ පෞද්ගලික ධන පරිත්‍යාගයෙන් ඉදි කර තිබූ රු 12,800,000 ක් පමණ වටිනා ගොඩනැගිල්ලක් හා ජාත්‍යන්තර ආයතනයක ආධාර මත ඉදි කර තිබූ රු 7,844,963 ක් වටිනා ගොඩනැගිල්ලක් ප්‍රතිකාර හා පුනරුත්ථාපන කටයුතු සඳහා භාවිතයට ගත හැකි පරිදි සියලු ලී බඩු හා උපකරණ වලින් සමන්විතව | මුදල් අමාත්‍යාංශයේ හා ජාතික අයවැය චක්‍රලේඛ අනුව බඳවාගැනීම් තාවකාලිකව නතර කරන ලද බැවින් පුරප්පාඩු පිරවීමට නොහැකි විය. අග්‍රාමාත්‍ය කාර්ය මණ්ඩල සමාලෝචන කමිටුවේ අනුමැතිය හා | පරිත්‍යාග වශයෙන් ලද ගොඩනැගිලි ලී බඩු හා උපකරණ ඵලදායී කාර්යයන්ට යොදා ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඇතත් එම ගොඩනැගිල්ල 2023 වර්ෂය තුල දී ඖෂධ වලට ඇබ්බැහි වූ තැනැත්තන් පුනරුත්ථාපන කටයුතු සඳහා භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි. මෙම ගොඩනැගිලි ඉදිකර මණ්ඩලය වෙත 2021 වර්ෂයේ බාර දී ඇති අතර අවශ්‍ය කරන යටිතල පහසුකම් හා කාර්ය මණ්ඩලය අනුයුක්ත කර ගැනීම සඳහා කටයුතු කර නොතිබීම ඊට හේතුවිය. | 2023.09.22 දින පැවති මණ්ඩලීය රැස්වීමේදී ලද අනුමැතිය පරිදි පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | |
| (ආ) | 2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහිවූ තැනැත්තන් (ප්‍රතිකාර පුනරුත්ථාපනය) පිළිබඳ පනත සංශෝධනය කිරීම සඳහා 2022 ජනවාරි 24 දින පැවති ආමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අමප/21/2279/303/176 මගින් අනුමැතිය ලබා දී තිබුනද පනතට අදාළ සංශෝධන කටයුතු නිම කර අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතුකර නොතිබුණි. | අධිකරණ අමාත්‍යාංශය මඟින් මෙම පනත සංශෝධනය කිරීම සිදු කරන අතර නීති කෙටුම්පත් සම්පාදක විසින් අවසන් සංශෝධිත කෙටුම්පත සකසා ඉදිරිපත් කර ඇති අතර නිවැරදි කිරීම් සිදු කර ඉංග්‍රිසි පරිවර්තනය ද සහිතව 2023.05.02 දින අධිකරණ අමාත්‍යාංශය හා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. | පනතතෙහි සංශෝධන කටයුතු කඩිනමින් සිදු කිරීමට පියවර ගත යුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණ

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය , ප්‍රධාන කාර්යාල හා පළාත් කාර්යාලයද ඇතුළුව 374 ක් වූ අතර තත්‍ය සේවක සංඛ්‍යාව 205ක් විය. එබැවින් පුරප්පාඩු සංඛ්‍යාව 169 ක් විය. මෙම පුරප්පාඩු වලින් තනතුරු හයකට අදාළව පුරප්පාඩු 29 පිරවීම සඳහා 2023 වර්ෂයේ බඳවා ගැනීම අයදුම්පත්‍ර කැඳවීම සිදුකර ඇතත් අධ්‍යක්ෂ මුදල් තනතුර සඳහා බඳවාගෙන ඇති අතර අධ්‍යක්ෂ ජනරාල් තනතුර සහ අධ්‍යක්ෂ පරිපාලන තනතුරු සඳහා බඳවා ගැනීම් කටයුතු කඩිනමින් සිදු කිරීමට පියවර ගෙන නොතිබුණි. | මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව 374 කි. (පළාත් කාර්යාල 33 ද එහි ඇතුලත්ව ඇත.) 2023.11.03 දිනැති ගැසට් පත්‍රය ප්‍රකාරව අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා තෝරාගත් නිලධාරියා සඳහා මණ්ඩලීය අනුමැතිය ලැබී නැත. අධ්‍යක්ෂ පරිපාලන තනතුරු සඳහා අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුව සුදුසු අයදුම්කරුවෙකු අයදුම්පත් ඉදිරිපත් කර නොතිබුණි.<br>මණ්ඩලීය ලේකම්/ නීති නිලධාරී තනතුර සඳහා එක් නිලධාරියෙකු තෝරා ගත් අතර එම නිලධාරියා වැඩ බාර ගැනීම ප්‍රතික්ෂේප කරන ලදී. විද්‍යාත්මක නිලධාරී තනතුර සඳහා 5 දෙනෙකු තෝරාපත් කර ගෙන ඇති අතර 2024.06.13 දින පත්වීම් | අධ්‍යක්ෂ ජනරාල් හා අධ්‍යක්ෂ පරිපාලන තනතුර ඇතුළු තනතුරු සඳහා බඳවා ගැනීම් කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ලබාදීමට නියමිත වේ. උපදේශන සහකාර නිලධාරීන් සඳහා බඳවා ගැනීමේ තරඟ විභාගය පැවැත්වීම සඳහා පොලිස් විභාග කොට්ඨාශය වෙත යොමු කර ඇත. | |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නීති විරෝධි මත්ද්‍රව්‍ය නිෂ්පාදනය ප්‍රවාහනය, විකිණීම සහ භාවිතයට එරෙහිව නිතිය ඵලදායී ලෙස බලාත්මක කිරීම සඳහා ජාතික මාදක රසායනාගාරයේ ක්‍රියාකාරී සැළැස්මට අනුව භෞතික ප්‍රගතිය පිලිබඳව ඉදිරිපත් කරන ලද දත්තයන්ට අනුව 2023 වර්ෂයේදී කිසිදු ප්‍රගතියක් ලබා ගෙන නොතිබූ යෝජිත එක් වැඩ සටහනක්ද ප්‍රගතිය සියයට 50-සියයට 75 අතර වැඩසටහන් 3 ක්ද සියයට 50- සියයට 25 අතර වැඩසටහන් 5 ක් ද විය. | ආයතන සම්බන්ධීකරණය කර ගැනීමට නොහැකි වීම,මාදක රසායනාගාරයේ ප්‍රමාණවත් විද්‍යාත්මක නිළධාරින් නොමැති වීම , විශ්ලේෂණ කටයුතු සඳහා අදාල ආයතන වෙතින් සාම්පල් යොමුකර නොතිබීම.ප්‍රතිපාදන නොමැති වීම. පරීක්ෂණ කට්ටල රසායනාගාරය වෙත නොලැබීම. අඩු ප්‍රගතිය ලබා ගැනිමට බලපාන ලද හේතුන් විය. | ක්‍රියාකාරී සැලැස්මේ වැඩසටහන් සැලසුම් කිරීමේ දී මූල්‍ය ප්‍රතිපාදන හා අදාල වන අනෙකුත් සංවිධාන කටයුතු සැලසුම් කර අපේක්ෂිත ඉලක්ක වෙත ළඟා වීමට කටයුතු කල යුතුය. |
| (ආ) | දරුවන් හා යෞවනයින් මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වීම වලකාලීමට කටයුතු කිරීම සඳහා නිවාරන අධ්‍යාපන හා පුහුණු අංශයේ සංයුක්ත සැලැස්මේ වැඩසටහන් 26කින් වැඩසටහන් 04ක් සියයට 75 වඩා අඩු භෞතික ප්‍රගතිය ක් ලබා ගෙන තිබුණි. | ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති වීම, මූල්‍ය ප්‍රතිපාදන නොලැබීම, රජය විසින් සංවිධානය කරනු ලබන ප්‍රදර්ශන නැවැත්වීම. අඩු ප්‍රගතිය ලබා ගැනිමට බලපාන ලද හේතුන් විය. | ක්‍රියාකාරී සැලැස්මේ වැඩසටහන් සැලසුම් කිරීමේ දී මූල්‍ය ප්‍රතිපාදන හා අදාල වන අනෙකුත් සංවිධාන කටයුතු සැලසුම් කර අපේක්ෂිත ඉලක්ක වෙත ළඟා වීමට කටයුතු කල යුතුය. |